සැ. යු. - (i) 2014.02.28 දින පළ වූ අංක 1,852 දරන ගැසට් පත්‍රයේ II සහ IV A කොටස් පළ නොවීය.

(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2014 වර්ෂය සඳහා වූ නුවරඑළිය අධිකරණ කලාපයන්ට අයත් ජූරි සභිකයින්ගේ නාමා ලේඛනයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,853 - 2014 මාර්තු මස 07 වැනි සිකුරාදා - 2014.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 74 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මාර්තු මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මාර්තු මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

73 - B 80817 - 300 (2014/03)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කේ. ජී. ඩී. චතුර මල්රාජ් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1995.08.21 වැනි දින ප්‍රදානය කර ඇති ක/ප්‍ර/ක/894 අංක දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දෙල්දූව කෝපියාවත්ත පදිංචි මැස්ටියගේ දොන් ඩැනී ගුණතිලක වෙත ප්‍රදානය කොට, පානදුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්ඩීඕ 24/206 යටතේ 1995.11.13 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2014.03.31 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

කේ. ජී. ඩී. චතුර මල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2013 මාර්තු මස 04 වැනි දින.

### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝපියාවත්ත පත්තුවේ 709 බී අරියගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දෙල්දූව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කළුතර මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මුපික 2844 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 47 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0847 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම-

*උතුරට* : 48 වැනි කැබැල්ල ;
*නැගෙනහිරට* : 49 වැනි කැබැල්ල ;
*දකුණට* : 66 වැනි කැබැල්ල ;
*බස්නාහිරට* : 46 වැනි කැබැල්ල.

03-11/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සිරිසෝම ලොකු විතාන වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1994.05.19 වැනි දින ප්‍රදානය කර ඇති කළු/ප්‍ර/කළු/263 අංක දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රජවත්ත කළුතර පදිංචි සේනානායක මුදියන්සේලාගේ සීලට් වෙත ප්‍රදානය කොට, කළුතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්ඩීඕ 11/155 යටතේ 1994.07.19 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2014.03.31 වැනි දිනට පෙර මාවෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

සිරිසෝම ලොකුවිතාන,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2012 ජූලි මස 23 වැනි දින.

### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කළුතර තොටමුණ උතුර කෝරළේ 729 එච් රජවත්ත අලුත් කොටස ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රජවත්ත (ෆුලර්ටන්වත්ත) නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කළුතර මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ක. ඉ. 530001 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 439 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0524 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන රජයේ ඉඩම-

*උතුරට* : 440, 433 සහ 434 වැනි ඉඩම් කැබලි ;
*නැගෙනහිරට* : 434, 490 ඉඩම් කැබලි ;
*දකුණට* : 490, 438 ඉඩම් කැබලි ;
*බස්නාහිරට* : 438, 441, 440 ඉඩම් කැබලි.

03-11/2

**ඉඩම් සංවර්ධන නියෝගය (104 වැනි වගන්තියේ) 19 වැනි වගන්තියේ 4 වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රතිපාදන අවලංගු කිරීමේ දැන්වීම**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් යතුපිටි ඉන්දික මංජුල සිල්වා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) වගන්තිය ප්‍රකාර අංක ගම්/ප්‍රති/මීරි/1263 හා 1995.11.11 වැනි දින අතිගරු ජනාධිපති උතුමාණන් විසින් වේයන්ගොඩ උතුවම්බොගහවත්ත පරණ සමූපකාරයේ පතිරන්නැහැල්ලාගේ සරත් පතිරණ යන අයට දෙන ලද ප්‍රතිපාදන අවලංගු කරන බව මෙමගින් දැනුම් දෙන අතර ගම්පහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 2 බී අයි. එම්. 8 බී/103 යටතේ 1991.01.17 වැනි දින ලියාපදිංචි වී ඇත. පහත උපලේඛනයේ සඳහන් ඉඩම සඳහා නීත්‍යානුකූලව හිමිකම්පාන පුද්ගලයෙකු හෝ හිමිකම් කීමට කැමති ඔහු/ඇය සොයා ගැනීමට අපහසුවීම හේතුවෙන් එකී නිවේදනයේ 104 වගන්තිය යටතේ එම ඉඩම සඳහා හිමිකරුවකු නොමැතිබව වාර්තා වේ. කිසියම් මේ හා සම්බන්ධ විරෝධතාවයක් වී නම් 2014.03.31 වැනි දිනට පෙරාතුව ලිඛිතව මා වෙත දැනුම් දිය යුතු වේ.

වයි. අයි. එම්. සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2013 පෙබරවාරි මස 15 වැනි දින.

**උපලේඛනය**

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මීරිගම බල ප්‍රදේශය තුළ මැද පත්තුව අංක 337 බී මාලිගාතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් වදුරව නමැති ගමේ පිහිටි බලයලත් සර්වේ ජනරාල් විසින් සකසන ලද අංක ................ දරන රේඛා සටහනේ/ගම්පහ සර්වේ අධිකාරී විසින් සකසන ලද අංක පි. පී. ගම් 1117 දරන සැලැස්මේ සර්වේ ජනරාල් විසින් සකසන ලද අංක 60/1/3 (L/2/14) දරන ක්ෂේත්‍ර සටහනේ පිළියෙල කල කැබලි අංක 101 ලෙස සලකුණු කරන ලද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.260 වූ රජයේ ඉඩම් කොටසට මායිම්.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 99 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 24 ; |
| *දකුණට* | : | කැබලි අංක 102 ; |
| *බස්නාහිරට* | : | කැබලි අංක 100. |

03-11/3

---

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සුජානි මහේෂා සිල්වා වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1990.03.26 වැනි දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/10661 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පාන්තිය පදිංචි දොඩන්ගොඩ හේවාගේ ජේම්ස් අප්පුහාමි වෙත ප්‍රදානය කොට මතුගම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 25/193 යටතේ 1991.12.06 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2014.03.31 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

සුජානි මහේෂා සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
මතුගම.

2013 අගෝස්තු මස 05 වැනි දින.

**උපලේඛනය**

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉද්දගොඩ පත්තුවේ පාන්තිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පාන්තිය නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කළුතර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක මු. පි. ක. 2340 දරන පිඹුරේ අංක 11 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.105ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම. පිටකුඹුරුකන්ද මූකලාන.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි. ක. 1270/2 ; |
| *නැගෙනහිරට* | : | මු. පි. ක. 2340 හි ලොට් අංක 12 ; |
| *දකුණට* | : | පාර ; |
| *බස්නාහිරට* | : | මු. පි. ක. 2340 හි ලොට් අංක 10. |

03-11/4

---

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

බස්නාහිර පළාත් සභාවේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් බුද්ධි තරංගා කරුණාසේන වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1994.11.08 වැනි දින ප්‍රදානය කර ඇති අංක කො. ප්‍ර. මහ 18 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 644, කොට්ටාව, පන්නිපිටියේ පදිංචි ජයතුංග ආරච්චිගේ සෝමලතා වෙත ප්‍රදානය කොට කොළඹ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඉ. සං. දි. එම්.2/164 යටතේ 95/12/21 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමිකරුවෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු

සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2014.03.31 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2013 අගෝස්තු මස 29 වැනි දින.

**උපලේඛනය**

කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සල්පිටි කෝරළේ කොට්ටාව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොට්ටාව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කොළඹ දිස්ත්‍රික් මැනුම් අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක මු. පි. කො. 74186 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 32 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0361 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම. ගොඩ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 13 සහ 31; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 31 ; |
| *දකුණට* | : | කැබලි අංක 35 ; |
| *බස්නාහිරට* | : | කැබලි අංක 12 සහ 13. |

03-11/5

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … … | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) … … | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) … … | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) … … … … … … … … | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) … … … … … … … … | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)… … | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය… … … … … … … … | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 00 | 60 00 |
| III වැනි ඡේදය … … … … … … … | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 00 | 120 00 |
| II වැනි කොටස … … … … … … … … | 12 00 | 60 00 |
| III වැනි කොටස … … … … … … … … | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 00 | 60 00 |
| V වැනි කොටස … … … … … … … … | 123 00 | 60 00 |
| VI වැනි කොටස … … … … … … … … | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| මාර්තු | 2014.03.07 | සිකුරාදා | 2014.02.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.14 | සිකුරාදා | 2014.02.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.21 | සිකුරාදා | 2014.03.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.28 | සිකුරාදා | 2014.03.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2014.04.04 | සිකුරාදා | 2014.03.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.11 | සිකුරාදා | 2014.03.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.17 | බ්‍රහස්පතින්දා | 2014.04.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.04.25 | සිකුරාදා | 2014.04.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2014.05.02 | සිකුරාදා | 2014.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.09 | සිකුරාදා | 2014.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.16 | සිකුරාදා | 2014.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.23 | සිකුරාදා | 2014.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.30 | සිකුරාදා | 2014.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
*රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.